යටවත්ත ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට යටවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2015 වර්ෂයේ ඉඩම් විකුණුම් මත අයකළ සියයට එකක බදු වටිනාකම වූ රු.736,000ක් ආදායමට නොගෙන තැන්පත්වල රඳවා තිබීම හේතුවෙන් එම බදු ආදායම සමාන අගයෙන් අඩුවෙන් දැක්වුණි.

(ආ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරිම වෙනුවෙන් පළාත් නැඟුම ව්‍යාපෘතිය යටතේ ලැබිය යුතු මුදල රු.302,991කින් වැඩියෙන් දැක්වීමෙන් ණයගැති ශේෂය වැඩියෙන් දැක්වුණි.

(ඇ) 2014 වර්ෂයට අදාලව දොරින් දොරට ගමින් ගමට වැඩසටහන යටතේ රු.350,000ක හා රු.500,000ක ප්‍රතිපාදන වෙන්වී තිබුණු ව්‍යාපෘති 02 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ඉටුකර නොතිබියදී ණයගැති හා ණයහිමි ලෙස දැක්වීම හේතුවෙන් ණයගැති හා ණයහිමි ශේෂයන් රු.850,000කින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) 2014 වර්ෂයේ දෙසැම්බර් මස පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබූ රු.191,533 ක් වටිනා ගැල්වනයිස් බට 173 ක වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) කර්මාන්ත ණයහිමි ශේෂ 3 ක වටිනාකම රු.804,452 කින් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වුණි.

1.3.2 ලැබිය යුතු ගිණුම්

--------------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 04 ක වටිනාකම රු.1,231,286 ක් වූ අතර, ඊට වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ රු.22,000 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

---------------------

ගෙවිය යුතුව තිබූ ණයහිමි ගිණුම් ශේෂ 07 ක වටිනාකම රු.13,993,623 ක්වූ අතර, වර්ෂ 03 කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.203,977 ක් වු ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-------------------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාළව උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.351,752ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

-----------------------------------------------------

නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ). 1988, ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ | |
| (i) 115 රීතිය | ද්‍රව්‍ය / භාණ්ඩ ගබඩාවට ලැබුණු බවට සහතික වීමෙන් පසුව පමණක් ගෙවීම් කළයුතු වුවත්, ද්‍රව්‍ය ලද බවට අක්‍රමිකව සටහන් තැබීමෙන් පසුව, ගෙවීම් කිරීම සඳහා රු.209,660 ක් වටිනා චෙක්පත් 04 ක් ලියා තිබුණි. |
| (ii) 218 රීතිය. | 1987 න් පසු සභාවේ ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| 571 (2) | අවු 02 සිට 14 දක්වා කාලයක සිට පැවත එන රු.35,102 ක් වටිනා කල්ඉකුත් වූ කර්මාන්ත අතරැදි මුදල් නිරවුල් කර නොතිබුණි. |
| (ඇ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/ 2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමේදී අධ්‍යාපන සුදුසුකම් වශයෙන් 8 ශ්‍රේණිය සමත් වීම අවශ්‍යතාවයක්ව තිබියදී, ඊට අනුකූල නොවී කම්කරු තනතුරු 2 ක් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි. කැලි පදනමට බඳවා ගැනීම සඳහා චක්‍රලේඛය මඟින් ඉඩකඩ සලසා නොතිබුණු නමුත්, ඊට අනුකූල නොවී ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා නොමැති අයෙකු විදුලි කාර්මික තනතුරට බඳවා ගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,279,479 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,111,150 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.831,671 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
--------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 2 ක කාලපරිච්ඡේදය තුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ) මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට එම ප්‍රතිශතයේ අඛණ්ඩ පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

(ආ) මුළු වියදම හා මුළු ආදායම අතර අනුපාතයේ ප්‍රතිශතය අඛණ්ඩ ඉහළ යාමක් පෙන්නුම් කෙරෙන අතර, මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් එමඟින් පෙන්නුම් නොකෙරේ.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 අක්කර බදු
---------------

2015 දෙසැම්බර් 31 දිනට රු. 48,106 ක හිඟ අක්කර බදු ශේෂයක් විය.

2.3.2 ජල ගාස්තු
------------

2015 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු ශේෂය රු. 85,680 ක් විය.

2.3.3 කසළ ගාස්තු
------------------

සභා බල ප්‍රදේශයේ එකතු කරන කසල වෙනුවෙන් කසල ගාස්තුවක් අයකර තිබූ අතර, 2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි කසල ගාස්තු ශේෂය රු.15,350 ක් විය.

2.3.4 වෙනත් අදායම්
---------------

අනුමැතිය ලබාදී තිබූ ගොඩනැගිලි අයදුම්පත් 113 ක් සඳහා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව අනුකූලතා සහතික නිකුත් කර නොතිබූ බැවින් සභාවට රු.84,750ක ආදායමක් අහිමි වී තිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 538,811 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.4,206,265ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර

-----------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂයන් තුල පනවන ලද අධිභාර වලට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට රු. 32,259 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන ප්‍රජාශාලා 15 ක් පිහිටි ඉඩම් සහ සුසාන භූමි 26ක් සම්බන්ධ හිමිකම් ඔප්පු හා මිනින්දෝරු සැලසුම් නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ දොරින් දොරට ගමින් ගමට වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන්වී තිබුණු ව්‍යාපෘති 07 ක් සඳහා සභාව රු.1,060,151 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර, අදාල මුදල් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

3.2 හඳුනාගත් අලාභ

--------------------

2002 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය සඳහා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත රු.5,807ක අධිභාර මුදලක් ගෙවා තිබුණි.

3.3 වත්කම් කළමණාකරණය

-------------------------

නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------

2008- 2014 වර්ෂ දක්වා වූ කාලපරිච්ඡේදය තුල මිලදී ගෙන තිබුණු රු.1,371,627 ක උපකරණ ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

(අ) ඩන්ගන් වත්ත පෙර පාසැල් ගොඩනැගිල්ල හා ළමා උද්‍යානය සංවර්ධනය කිරීම.

------------------------------------------------------------------------------------------

2013 හා 2014 පළාත් නිශ්චිත සංවර්ධන යෝජනා යටතේ ඩන්ගන් වත්ත පෙර පාසල් ගොඩනැගිල්ල හා ළමා උද්‍යානය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා රු.710,497 ක් වැයකර තිබු අතර, ඉදිකිරීම් සිදුකළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඩංගම ගමට ප්‍රවේශවන මාර්ගය සංවර්ධනය කිරීම

-----------------------------------------------------------

2015 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු1,000,000 ක ප්‍රතිපාදන මත ඉඩංගම ගමට ප්‍රවේශවන මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය රු.985,000 ක මුදලකට 2015 ජුලි 27 දින ගොවි සංවිධානයක් සමඟ ගිවිසුම්ගතව තිබුණි. පළාත් ඉංජිනේරු විසින් 2015 වර්ෂයේ අවස්ථා දෙකකදී සිදුකළ හැමර් ටෙස්ට් පරීක්ෂාවන් අනුව කර්මාන්තය දුර්වල බව වාර්තා කර තිබුණි. 2015 සැප්තැම්බර් මාසයේ කර්මාන්තයේ වැඩ නිම කර තිබුණද. 2016 අප්‍රේල් 04 වන විටද, එකී කර්මාන්තය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම

--------------------------------

පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ රු.43,910,000 ක ඇස්තමේන්තුවක් මත සහා කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කර්මාන්තය ඉටුකළ පුද්ගලික කොන්ත්‍රාත්කරු ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ජලය ප්‍රාදේශීය සභා ජල පද්ධතියෙන් සෘජුවම ලබාගෙන තිබු නමුත් පරිභෝජනය කළ ජල පරිමාව හඳුනාගෙන අයකිරීමක් සිදුකර නොතිබුණි.

3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

-------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ මහවෙල ජල ව්‍යාපෘතිය නඩත්තු කිරීමේ කර්මාන්තය සඳහා රු.300,000 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාල කර්මාන්තයේ වැඩ ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

කසල කළමනාකරණ ක්‍රියාවලිය සඳහා 2012 වර්ෂය වන විට පළාත් නිශ්චිත ප්‍රදාන හා සභා අරමුදල් රු.659,062 ක් වැයකර ගොඩනැඟිල්ලක් ඉදිකර තිබුණු අතර, එය කසල කළමනාකරණ ක්‍රියාවලිය සඳහා යොදා නොගෙන එහි අබලි ද්‍රව්‍ය ගොඩගසා තිබුණි. සභාව විසින් බල ප්‍රදේශයේ සුළු කොටසක පමණක් කසල එකතු කිරීමත්, නොදිරන ද්‍රව්‍ය ආවරණයක් නොමැතිව පුළුස්සා දැමීමත් සිදුකිරීම නිසා පරිසරයට හානිකර තත්ත්වයක් උද්ගත වී තිබුණි. ප්‍රාදේශීය සභාව නිසි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියකට යොමුවී නොතිබුණි.

3.7 අවිධිමත් ගණුදෙනු

-------------------

(අ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද විධිමත් පත්වීම් ලිපියක් නොමැතිව සභාවේ කාර්මික නිලධාරී තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු විශ්‍රාමික නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.186,000 ක මුදලක් දීමනා ලෙස සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) මහජන නියෝජිතයින්ගේ ධුරකාලය 2015 මැයි 15 දිනෙන් අවසන් වී තිබූ නමුත්, මැයි මාසයට අදාළ මන්ත්‍රී ඉන්ධන දීමනාව සම්පූර්ණ මාසයටම ගෙවා තිබීමෙන් රු.7,500 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
-----------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) ආදායම් විෂයයන් 04 ක් සඳහා රු.10,510,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණු නමුත්, එම ආදායම් උපයා ගැනීමට සභාව සමත් වී නොතිබුණු අතර, ආදායම් විෂයයන් 18 ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 34 සිට සියයට 95 අතර පරාසයක විචලනයන් පැවතුණි.

(ඇ) වැය විෂයයන් 36 ක් සඳහා සලසාදී තිබූ රු.18,730,824ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණු අතර වැය විෂයයන් 29ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර සියයට 38 සිට සියයට 97 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
---------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සිපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ණයගැති හා ණය හිමි පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පාලනය